# ජාතික හරිත ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධ උපදෙස් පත්‍රිකාව

"රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ගොඩනැගිල්ලක් සඳහා හරිත ප්‍රමිති මට්ටම් ලබා ගැනීමට ප්‍රථම අදාළ ගොඩනැගිල්ල නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් රෙගුලාසි හා කළාපීකරණ සැලැස්මට අනුකූල වන බවට නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයෙන් / අදාළ උප කාර්යාල වලින් මූලික සැලසුම් නිරාකරණයක් ලබ ගත යුතුය."

## 01. හරිත මට්ටම ලබා ගැනීමට ලියපදිංචිය

මූලික සැලසුම් නිරාකරණ අයදුම්පතට සමගාමීව නාගරික සංවර්ධන අධිකාරියේ පරිසර හා භූ දර්ශන අංශයෙන් ගොඩනැගිල්ල සඳහා හරිත මට්ටම ලබා ගැනීමට ලියපදිංචි විය යුතුය.

**ලියපදිංචි වීමට අවශ්‍ය දෑ:**

- නාගරික සංවර්ධන අධිකාරියේ පරිසර හා භූ දර්ශන අංශයෙන් හෝ අදාළ උප කාර්යාල වලින් මේ සඳහා ලියපදිංචි වීමේ අයදුම්පත්‍රයක් ලබාගත යුතුය.
- අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේදී,
    - තෙවන පාර්ශවයක් හරහා අදාළ ක්‍රියාවලියට මැදිහත් වී සිටීනම් , සේවාලාභියාගේ විරුද්ධත්වයක් නොමැති බව හා බලය පැවරීම සඳහා වන ලිපියක් ,
    - අයදුම්පත්‍රය අවසානයෙහි සේවාලාභියාගේ **අත්සන** සටහන් කිරීම හා
    - සේවාලාභියාගේ හෝ ක්‍රියාවලියට මැදිහත් වී සිටීන පාර්ශවයේ **ඊ ලිපිනය** නිවැරදිව සටහන් කිරීම අනිවාර්ය වේ.
- සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය සමග ගොඩනැගිල්ල ඉදිකරනු ලබන භූමියේ මිනින්දෝරු සැලැස්මේ පිටපතක් හා ස්ථානීය සිතියමක් හා සේවාලාභියාගේ

ජාතික හැඳුනුම්පතේ පිටපතක් අමුණා තිබිය යුතු අතර සේවාලාභියා සමාගමක් නම් ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ හා VAT ලියාපදිංචි කිරීමේ සහතික වල පිටපත් අමුණා තිබිය යුතුය.

- මේ සදහා ලියාපදිංචි ගාස්තු වශයෙන් රු 5000.00 ක මුදලක් හා සහ අදාළ බදු මුදල් NBT + VAT ගෙවිය යුතුය.
- එහිදී එම ගොඩනැගිල්ල වෙනුවෙන් ලියපදිංචි අංකයක් ලබා දෙන අතර , හරිත ගොඩනැගිලි ප්‍රමිති මට්ටම් ඇගයීමේ ක්‍රියාවලිය අඩංගු ග්‍රන්තයක් ලබා දේ.

## 02. සැලසුම් ඇගයීමේ අදියර

මෙම අදියරේදී මූලිකවම සිදුවන්නේ ගොඩනැගිල්ල වෙනුවෙන් සැකසූ සැලසුම් ඇගයීමට ලක් කිරීමයි.

- ගොඩනැගිල්ලේ භූමි වර්ගඵලය සඳහන් කරමින් e mail පණිවිඩයක් සේවාලාභියා විසින් තම ලියාපදිංචි අංකයද සඳහන් කරමින් greenrating.uda@gmail.com ලිපිනයට යොමු කළ යුතු අතර ඊට අදාලව සකස් කරන ලද සැලසුම් ඇගයීමේ අදියර ක්‍රියාත්මක කිරීමේ ගෙවීම් විස්තරය සහිත ලිපිය නාගරික සංවර්ධන අධිකාරියේ පරිසර හා භූ දර්ශන අංශයෙන් හෝ අදාළ උප කායීාල වලින් නිකුත් කිරීම සිදුකරනු ලබයි.
- ගාස්තු වශයෙන් ලිපියේ සදහන් මුදල හා අදාළ බදු මුදල් NBT + VAT ගෙවිය යුතුය.
- මේ අතරතුර පළමු අදියරේ ලබා දුන් හරිත ප්‍රමිති මට්ටම් ඇගයීමේ ක්‍රියාවලිය අඩංගු ග්‍රන්තයේ DA කොටසේ ඉල්ලුම් කර ඇති ලේඛන / සැලසුම් නාගරික සංවර්ධන අධිකාරියේ පරිසර හා භූ දර්ශන අංශය වෙත භාර දිය යුතුය. (මෘදු හා දෘඩ පිටපත් වශයෙන් භාර දීම සිදුකළ හැකිය). සැලසුම් නිර්මාණය කිරීමේ මූලික අදියරේ සිටම හරිත ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධයෙන් පළපුරුදු උපදේශක වරයකුගේ සහයෝගය අයදුම්කරු විසින් ලබගත යුතු හා අදාළ වරලත් විශේෂඥයන්ගේ සහතික කිරීම් අදාළ ලේඛන සමඟ අමුණා තිබිය යුතුය.

- ලේඛන / සැලසුම් භාර දීම හා ගෙවීම් සිදුකිරීමෙන් අනතුරුව **රාජකාරි දින 14 ක් ඇතුලත** මෙම සැලසුම් හරිත තාක්ෂණික කමිටුවේ ඇගයීමෙන් හා විද්වත් කමිටුවේ අධීක්ෂණයෙන් පසු එම ගොඩනැගිල්ල සඳහා ලබා දිය හැකි ලකුණු මට්ටම නිකුත් කෙරේ.
- ඉන් අනතුරුව ප්‍රමාණවත් ලකුණු මට්ටම (40=<) ලබාගෙන ඇත්නම් පමනක් ඉදිරි කටයුතු සඳහා යොමු විය හැකි අතර, ගොඩනැගිල්ල ඉදිකිරිම ආරම්භ කරන්නේනම්, ඒ බව ලිඛිතව නාගරික සංවර්ධන අධිකාරියේ පරිසර හා භූ දර්ශන අංශය වෙත දැන්විය යුතුය. ගොඩනැගිල්ල ඉදිවන අතරතුර නාගරික සංවර්ධන අධිකාරියේ තාක්ෂණික කමිටුව මගින් අවම වශයෙන් තෙවරක් ඉදිකිරීම් නිරීක්ෂණය සදහ පැමිණෙනු ඇත.

## 03. නිර්වද්‍යතා ඇගයීම

- මේ සඳහාත් නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ පරිසර හා භූ දර්ශන අංශයෙන් හෝ උප කාර්යාල වලින් ගොඩනැගිල්ලේ භූමි වර්ගඵලයට අදාලව සකස් කරන ලද නිර්වද්‍යතා ඇගයීම අදියර ක්‍රියාත්මක කිරීමේ ගෙවීම් විස්තරය සහිත ලිපියක් ලබාදීම සිදුකරන අතර
- මේ සඳහා පළමු අදියරේ ලබා දුන් හරිත ප්‍රමිති මට්ටම් ඇගයීමේ ක්‍රියාවලිය අඩංගු ග්‍රන්තයේ CVA කොටසේ ඉල්ලුම් කර ඇති ලිපි ලේඛන නාගරික සංවර්ධන අධිකාරියේ පරිසර හා භූ දර්ශන අංශය වෙත ලබා දිය යුතුය.
- මෙම සැලසුම් තාක්ෂණික කමිටුවේ ඇගයීමෙන් හා කළමනාකරණ මණ්ඩලයේ අධීක්ෂණයෙන් හා අනුමැතියෙන් අනතුරුව එම ගොඩනැගිල්ල සඳහා ලබා දිය හැක් අවසාන ලකුණු මට්ටමට අදාළ හරිත සහතික නිකුත් කෙරේ.
    - ලකුණු ගණන 40-49 ත් අතර නම් සහතික මට්ටම ද
    - ලකුණු ගණන 50-59 ත් අතර නම් රිදී මට්ටම ද
    - ලකුණු ගණන 60-69 ත් අතර නම් රන් මට්ටම ද
    - ලකුණු ගණන 70ට වැඩි නම් ප්ලැටිනම් මට්ටම ද ලබා දේ.

**සැ.යු.:**

- සියළුම ගෙවීම් නාගරික සංවර්ධන අධිකාරියේ මූල්‍ය අංශය (6 වන මහළ) වෙත සිදු කළ යුතුය.
- සියළුම ගෙවීම් සිදුකළ හැක්කේ පෙ.ව. 8.30 සිට ප.ව. 12.30 දක්වා හා ප.ව.1.00 සිට ප.ව.3.00 දක්වා පමණි.
- මුදල් හා චෙක් පත් මඟින් පමණක් ගෙවීම් සිදු කළ යුතුය.
- ඔබ දැනටමත් VAT බදු ගෙවන අයෙක් නම්, මේ සඳහා ඔබ විසින් ගෙවීම් සිදු කරන ලද VAT ප්‍රතිෂතයට අදාළ තහවුරු කිරීමක් මතුවට අපේක්ෂා කන්නේ නම් ඒ සඳහා ගෙවීම් සිදු කිරීමට පෙර දැනුම් දීමක් සිදුකල යුතුය.

**වැඩිදුර තොරතුරු සඳහා විමසන්න**

පරිසර හා භූ දර්ශන අංශය
07 වන මහල
නාගරික සංවර්ධන අධිකාරිය
"සෙත්සිරිපාය", බත්තරමුල්ල

දුරකථන අංක: 011-2875912/ 011-2875905
ඊ ලිපිනය : greenrating.uda@gmail.com
ෆැක්ස් අංකය: 011-2883670